# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2136/13 - 2019 අගෝස්තු මස 13 වැනි අඟහරුවාදා - 2019.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : KOT/LND/ACQVI/01/66.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* :
4-3/15/2014/VE/286.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය* :

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොටපොල උතුර ග්‍රාම නිලධාරී වසමේ දියදාව ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 45හි පත්‍ර 124 හි අතිරේක අංක 96 හි කැබලි අංක 2338 හා 2339 වශයෙන් වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.5116 ක් වූ දියදාව වත්ත ක්ෂේත්‍ර අංක 07 නමැති ඉඩම් කැබලිවලට මායිම් :

කැබලි අංක 2338 – **ඉඩමේ නම:** දියදාව වත්ත ක්ෂේත්‍ර අංක 07; **හිමිකම් කියන්නා:** සී/ස තලවකැලේ වැව්ලි සමාගම, අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10; **ප්‍රමාණය:** හෙක්ටයාර් 0.2884.

*උතුරට*: කැබලි අංක 103; *නැගෙනහිරට*: මාර්ගය; *දකුණට*: මාර්ගය සහ පුහුල් දොල; *බස්නාහිරට*: කැබලි අංක 103.

**කැබලි අංක 2339 – ඉඩමේ නම: දියදාව වත්ත ක්ෂේත්‍ර අංක 07; හිමිකම් කියන්නා: සී/ස තලවකැලේ වැව්ලි සමාගම, අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2232.**

*උතුරට*: මාර්ගය සහ කැබලි අංක 103; *නැගෙනහිරට*: කැබලි අංක 103 සහ පුහුල් දොල; *දකුණට*: පුහුල් දොල; *බස්නාහිරට*: මාර්ගය.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2019.09.30 දින පෙ.ව. 10.00ට කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019.09.23 වැනි දිනට මත්තෙන් ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ

1A - G 30727 - 37 (2019/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිලිවලින් දැනුම් දිය යුතුයි.

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2019 අගෝස්තු මස 09 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 989

---

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : DNK/LNDI/DEACQ/12/08.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/13/2014/HA/199.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර කිරිමැටියාන ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ අංක පු 5421 හා 2019.01.24 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0066 ක් පමණ වන මුලන්කාඩුකැලේ හෙවත් මැද මූකලාන නමැති ඉඩම් කැබැල්ල :

**කැබලි අංකය 01**

ඉඩමේ නම: මුලන්කාඩුකැලේ හෙවත් මැදමූකලාන; හිමිකම් කියන්නා: කේ. එල්. එම්. කේ. කරුණානායක; ප්‍රමාණය: හෙක්. 0.0066.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.09.23 වන දින පූ.භා. 11.30ට දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019.09.09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

දිලාන් ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්,
දංකොටුව.

2019 අගෝස්තු මස 05 වැනි දින,
දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-990

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.